## කලාප අධ්‍යාපන කාර්යාලය - දෙහිඕවිට

විෂය - බුද්ධ ධර්මය

කෙටි ප්‍රශ්නාවලිය

ශ්‍රේණිය - 10

සැකසුම :-ඒ.වී.චමින්ද විජේකුමාර ආරියදාස මයා

Zonal Education Office – Dehiowita/ Zonal Education Office – Dehiowita/ Zonal Education Office – Dehiowita/ Zonal Education Office – Dehiowita/ Zonal Education Office – Dehiowita/ Zonal Education Office – Dehiowita/ Zonal Education Office

### 1 අභියෝග ජයගත් සිදුහත් බෝසතාණෝ

1. පංච මහා විලෝකනය යනු කුමක් ද?
2. බෝසත් උපත සිදු වූ විගස වෙනත් කිසිදු උපතක දක්නට නොලැබෙන ආශ්චර්යමත් සිදුවීම් මොනවා ද?
3. සිදුහත් කුමරු ශිල්ප ශාස්ත්‍ර උගත් බමුණු පඬිවරයා කවු ද?
4. සිදුහත් කුමරුගේ ළමා අවදියේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ මොනවා ද?
5. සිදුහත් කුමරු ස්වයංවරයෙන් තෝරා ගත් කුල කුමරිය වන්නේ,
6. ගිම්හාන, හේමන්ත, වස්සාන යන ඍතු තුනට අනුරූප වන පරිදි සිදුහත් කුමරුට සාදා දුන් මාලිගා නම් කරන්න.
7. මහාමායා දේවිය කලුරිය කළේ බෝසත් උපත සිදු වී දින කීයකින් ද?
8. ඡන්න ඇමති සමඟ රජ උයනට යන අතර මඟ දී සිදුහත් කුමරු දුටු සතර පෙර නිමිති නම් කරන්න.
9. යසෝදරා දේවිය පුතකු ලද බව දැනගත් පසු සිදුහත් කුමරුගේ මුවින් පිට වූ පාඨය කුමක් ද?
10. තේජසින් සපිරි, එහෙත් ශාන්ත වූ, ප්‍රියංකර වූ, බෝසතුන්ගේ අනුපමේය රූපශ්‍රීය දැක නිබ්බුත පද කීවේ කවර තැනැත්තියක් ද?
11. බෝසතාණන් වහන්සේ වසර කීයක් දුෂ්කර ක්‍රියා කළේ ද?

### 2 නමදිමු අගයමු මහ සඟරුවනා

12. බුදුරදුන් තම පැවිදි ශ්‍රාවකයන් හැඳින් වූ නම කුමක් ද?
13. සංඝ සමාජය ආරම්භ වන්නේ කුමන පිරිසක් පැවිදි වීමෙන් පසුව ද?
14. ත්‍රිවිධ රත්නය නම් කරන්න.
15. ගැබිනි මාතාවන්ට විශේෂ වශයෙන් දේශනාකර ආශිර්වාද ලබා ගන්නා සූත්‍ර දේශනාව කුමක්ද?
16. මහ සඟරුවන තම සේවාවන් සපයන අංශ තුනක් දක්වන්න.

### 3 තෙරුවන ගුණ හැඳින ගනිමු

17. තෙරුවන කෙරෙහි පැහැදීම ....................යි.
18. සංඝරත්නය මෙලොව ඇති වූයේ කිනම් පොහෝ දිනක ද?
19. බෞද්ධයකු වීමේ පළමු පියවර කුමක් ද?
20. බුද්ධ රත්නයේ ගුණ කීය ද?

chamindawijekumara@gmail.com

21. ‘‘රහසත් පවු නොකොට - කෙළෙසරයනුක් දුරු කොට’’ යන කවියෙන් කියවෙන්නේ බුදුරජාණන් වහන්සේගේ ........................ ගුණය ගැනයි.
22. ධර්ම රත්නයේ ගුණ කීය ද?
23. සංඝ රත්නයේ ගුණ කීය ද?
24. තෙරුවන් ගුණ කීය ද?

## 4 කුසල් සිත් වැඩි දියුණු කරමු

25. නීවරණ ධර්ම සංඛ්‍යාත්මකව කීය ද?
26. නීවරණ ධර්ම නම් කරන්න.
27. බුදු දහමෙහි ඉගැන්වෙන භාවනාවෙහි පරමාර්ථය කුමක් ද?
28. භාවනාව දෙවැදෑරුම් වේ. එම දෙයාකාරය නම් කරන්න.
29. සමථ භාවනාව හඳුන්වන වෙනත් නම් 02ක් ලියන්න.
30. භාවනාව පිළිබඳ අර්ථ විග්‍රහ කර ඇත්තේ කෙසේ ද?
31. සමථ භාවනාව පිළිබඳ අර්ථ විග්‍රහ කර ඇත්තේ කෙසේ ද?
32. සමාධි භාවනාව වඩන පුද්ගලයෙකුට තෝරා ගත හැකි අරමුණු හෙවත් කර්මස්ථාන ගණන කීය ද?
33. පුද්ගල චරිත ගණන කීය ද?
34. පුද්ගල චරිත නම් කරන්න.
35. භාවනාවට පිවිසෙන තැනැත්තා ඉටුකර ගත යුතු පූර්ව අවශ්‍යතා මොනවා ද?
36. භාවනා කළ හැකි ඉරිව් ගණන කීය ද?
37. භාවනා කළ හැකි ඉරියව් නම් කරන්න.
38. බුදු ගුණ භාවනාව හඳින්විය හැකි වෙනත් නමක් ලියා දක්වන්න.

## 5 විදසුන් වඩන්නෝ අති තතු දකින්නෝ

39. විපස්සනා හෙවත් විදර්ශනා යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
40. ත්‍රිලක්ෂනය නම් කරන්න.
41. විපස්සනා භාවනාව හඳුන්වන තවත් නම දෙකක් ලියා දක්වන්න.
42. විපස්සනා භාවනාව පිළිවඳව අර්ථ විග්‍රහකර ඇත්තේ කෙසේ ද?
43. ලෝකය හා ජීවිතය පිළිබඳ අපට ඇති කර ගත හැකි අවබෝධය දෙයාකාරය. එය නම් කරන්න.
44. බුදුරජාණන් වහන්සේ විසින් පැහැදිලි කර ඇති පරිදි ස්කන්ධ ධර්ම සංඛ්‍යාව කොපමන ද?
45. එම ස්කන්ධ නම් කරන්න.

## 6 සසුන් කෙත සරු කළ, උතුමෝ ගුණැති පෙරකළ

46. කුලතුංග බණ්ඩාරගේ පැවිදි නම කුමක් ද?
47. කුලතුංග බණ්ඩාර වැලිවිට සරණංකර නමින් සූරියගොඩ විහිරයේ දී පැවිදි වූයේ ඔහුට වයස අවුරුදු කියක් වන විට ද?
48. ධර්ම විනය පිළිබඳ විශාරදයකු වූ වැලිවිට අසරණ සරණ සංඝරාජයාණන් වහන්සේ විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ කිහිපයක් නම් කරන්න.
49. වැලිවිට අසරණ සරණ සංඝරාජයාණන් වහන්සේගේ චරිතයේ කැපී පෙනෙන ගුණාංග තුනක් දක්වන්න.

chamindavijeekumara@gmail.com

50. දුටුගැමුණු මහ රජතුමාගේ දෙමව්පියන් කවුරුන් ද?
51. දුටුගැමුණු රජතුමාගේ ප්‍රධානතම ශාසනික මෙහෙවර වූයේ කුමක් ද?
52. මහා සෑයට පමණක් දෙවෙනි වන දුටුගැමුණු රජතුමා ඉදිකළ ගොඩනැගිල්ල කුමක් ද?

## 7 මහලු වියෙහි දුක් නොවන්න තුරුණු දිවිය ගොඩනගන්න

53. මිනිස් ජීවිතයේ ප්‍රධාන අවධි තුන නම් කරන්න.
54. බුදු දහම තරුණ වියේ දී විශේෂයෙන් අවධානය යොමුකල යුතු අංග දෙකක් පිළිබඳව දක්වා ඇත. එම අංශ දෙක දක්වන්න.
55. **“උට්ඨානවතෝ සතිමතෝ”** යන ධම්ම පද ගාථාවෙහි ඇතුළත් දෙලොව දියුණුවට හේතුවන කරුණු හත නම් කරන්න.
56. මිනිස් ජීවිතයක වැදගත්ම අවධිය කුමක් ද?
57. **ධම්මජීවිනෝ** යනු .......................................දිවි පැවැත්මයි.

## 8 අනුසස් දැක සිල්වත් වෙමු

58. සිරිත් විරිත් යන්නෙහි අදහස ලියා දක්වන්න.
59. බුදු දහමෙහි **සීලය** අර්ථ දක්වා ඇත්තේ කෙසේ ද?
60. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස ගණන කීය ද?
61. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස 03ක් ලියා දක්වන්න.
62. බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයෙහි සිල්වත්ව කටයුතු නොකර උපයාගත් සියලු ධනය අහිමිකොට ගෙන ඉණ ඇඳි වස්ත්‍රය පමණක් ඉතිරිවූයේ කිනම් සිටුපුත්‍රයා හට ද?
63. බුදුරදුන් වැඩසිටි අවදියේ මරණාසන්න මොහොතේ ඌරෙකු මෙන් කෑගසා දැඩි වේදනාවක් විඳ මිය පරලොව ගොස් අපාගත වූයේ කවු ද?

## 9 සබඳතා රකින මිනිස් යුතුකම්

64. සිඟාලක නම් ගෘහපතියාට බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය කුමක් ද?
65. නැගෙනහිර, දකුණ, බටහිර, උතුර, යට සහ උඩ යන දිශාවන් වලින් දැක්වෙන සමාජ කොටස් නම් කරන්න.
66. සිඟාලෝවාද සූත්රයේ දැක්වෙන ආකාරයට භෝග විනාශයට හේතුවන කරුණු හය මොනවා ද?
67. සිඟාලෝවාද සූත්‍රයට අනුව දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටු විය යුතු යුතුකම් 03ක් ලියා දක්වන්න.
68. සතර අගති නම් කරන්න.
69. සතර කර්ම ක්ලේෂ මොනවාද?

## 10 රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්

70. බුදුරදුන් ද්‍රෝණ සූත්‍රය දේසනා කලේ කවරෙකු උදෙසා ද?
71. පද්මාකාර ජීවිතය යනු කුමක් ද?

chamindavijeekumara@gmail.com

72. අෂ්ටලෝක ධර්ම නම් කරන්න.
73. බුදුරදුන් පෙන්වා දී ඇති පරිදි සමාජයේ ජීවත් වන  පුද්ගල කොටස් තුනකි, නම්කරන්න.
74. තුන්තරා බෝධිය නම් කරන්න.
75. අනුසෝතගාමී සහ පටිසෝතගාමී යනු කුමක් ද?

## 11 සහජීවනය

76. ''සමගියම යහපති'' මෙහි පාලි පාඨය ලියන්න.
77. ''සමග්ගා හෝත මා විවදථ'' මෙහි තේරුම ලියන්න.
79.සිව් බඹ විහරණ නම් කරන්න.
78. සහජීවනය යනු කුමක් ද?

## 12 කර්මය හා එහි ප්‍රභේද හැඳින ගනිමු

79. කර්මය යනු කුමක් ද?
80. කර්මය සිදුවන දොරටු කිය ද?
81. කර්මය සිදුවන දොරටු නම් කරන්න.
82. තිදොරින් කරන කර්ම දෙයාකාර වේ. එම දෙයාකාරය නම් කරන්න.
83. බුදු දහමේ දැක්වෙන කුසල මූල 03 නම් කරන්න.
84. බුදු දහමේ දැක්වෙන අකුසල මූල 03 නම් කරන්න.
85. විපාක දෙන කාලය අනුව කර්මය සතරාකාර වේ. එම සතරාකාරය නම් කරන්න.
86. බුදුරදුන් කර්මය පිළිබඳව දේශනා කළ සූත්‍රයෙහි නම සහ එය දේශනා කළේ කවරෙකු හට දැයි දක්වන්න.
87. විපාක දෙන ආකාරය අනුව කර්ම සතරාකාරය. නම් කරන්න.
88. පංච නියාම ධර්ම නම් කරන්න.
89. **''යාදිසං වපතේ බීජං - තාදිසං හරතේ ඵලං''** සෙසු පද යුගල සම්පූර්ණ කරන්න.

## 13 ඇති තතු කියන තිලකුණු දහම

90. ත්‍රිලක්ෂණය නම් කරන්න.
91. පංචස්කන්ධය නාම රූප වශයෙන් වෙන් කොට දක්වන්න.
92. බුදුරදුන් දුක්ඛ සත්‍යයෙහි සත්ත්වයාට මුහුණපාන්නට සිදුවන දුක් දක්වා ඇත්තේ කෙසේ ද?

## 14 පටිච්ච සමුප්පාද න්‍යාය හැඳින ගනිමු

93. සැරියුත් මහ රහතන් වහන්සේගේ ගිහි කළ නම කුමක් ද?
94. **යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ''** ''සෙසු පද සම්පූර්ණ කරන්න.
95. බුදු දහමේ මූලික හරය වන්නේ කුමක් ද?
96. පටිච්ච සමුප්පාදය හඳුන්වන තවත් නමක් ලියා දක්වන්න.
97. පටිච්ච සමුප්පාද න්‍යාය ඉගැන්වෙන මූල සූත්‍රය ලියා දක්වන්න.
98. පටිච්චසමුප්පාද න්‍යාය පිළිබඳ කරුණු දොළහ(ද්වාදසාංග පටිච්චසමුප්පාදය) නම් කරන්න.

charindavijeekumara@gmail.com

## 15 සිව්සස් හැඳින සැනසුම ලබමු

99. බුදුවරයෙකු ලොව පහළ වන්නේ ඇයි?
100. බුදු දහමේ මූලික ඉගැන්වීම් තුනක් දක්වන්න.
101. චතුරාර්ය සත්‍යය පිළිවෙළින් නම් කරන්න.
102. චතුරාර්ය සත්‍ය පිළිබඳව දැක්වෙන සූත්‍රය කුමක් ද?
103. සසර දුක තුන් ආකාර යැයි ධර්ම විවරණ වල දැක්වේ. එම තුන් ආකාරය ලියා දක්වන්න.
104. ක්ලේශ ධර්මයන් අතර මූලික වන තණ්හාව මංගල ධර්ම දේශනාවේ දී තුන් ආකාරයකට බෙදා දක්වා තිබේ. එම තුන් ආකාරය නම් කරන්න.
105. ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිවෙළින් ලියා දක්වන්න.
106. නිවන් මගේ පියවර තුන නම් කරන්න.
107. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට අනුව බෙදා දක්වන්න.
108. බුදුරදුන් දම්සක්පැවතුම් සූත්‍රයෙහි දක්වා ඇති පරිදි අත්හල යුතු අන්ත දෙක මොනවා ද?
109. දුක්ඛ ආර්ය සත්‍යයෙහි දුක කොටස් තුනකට දක්වා ඇති. නම් කරන්න.
110. ත්‍රිවිධ තණ්හාව නම් කරන්න.
111. සම්මා ආජීවයට අයත් නිවැරදි දිවි පැවැත්මට අදාල නොකලයුතු වෙළදාම් පහ නම් කරන්න.

## 16 බුදු සිරිතයි - පරිසරයයි

112. පරිසරය ප්‍රධාන වශයෙන් දෙයාකාරය. නම් කරන්න.
113. සිදුහත් බෝසතාණන් වහන්සේගේ උපතේ සිටම පරිසරය ඇසුරු කළ අවස්ථා කිහිපයක් ලියා දක්වන්න.
114. බුදුරජාණන් වහන්සේ පළමු වන වස් කාලය ගත කළේ කොහේ ද?
115. බුදුරජාණන් වහන්සේ දහවන වන වස් කාලය ගත කළේ කොහේ ද?
116. බුදුරජාණන් වහන්සේ ස්වභාවික පරිසරය දම් සභා මණ්ඩප බවට පත් කර ගත් අවස්ථා කිහිපයක් ලියා දක්වන්න.
117. බුදුරජාණන් වහන්සේ මහා මොග්ගල්ලාන සූත්‍රය හා සාමඤ්ඤඵල සූත්‍රය දේශනා කළ ස්ථාන ලියා දක්වන්න.
118. බුදුරදුන් සොබාවික පරසරය වර්ණනා කළ සූත්‍ර දේශනා දෙකක් නම් කරන්න.
119. පරිසරය දූෂණය නොවන අයුරින් ක්‍රියා කිරීමට තම ශ්‍රාවකයන්ට බුදුරදුන් දුන් අවවාද මොනවාද?

## 17 නිරෝගී බව උතුම්ම ලාභය යි

120. බුදු දහමට අනුව පුද්ගලයාට වැළදෙන රෝග හඳුන්වන්නේ කෙසේ ද?
121. බුද්ධ වචනය අනුව රෝග දෙයාකාරය. එය නම් කරන්න.
122. බුදු රජාණන් වහන්සේ විසින් රෝග වැළදීමට හේතු වන කරුණු පිළිබඳව පහදා දුන් තෙරුන්වහන්සේ කවු ද?
123. රෝග වැළදීමට හේතු වන කරුණු අටෙන් 04ක් නම් කරන්න.
124. මානසික රෝග ඇතිවීමට කරුණු තුනක් දක්වන්න.

chamindawijeekumara@gmail.com

125. කායික හා මානසික නිරෝගී බව ඇති කරලීම සඳහා බුදුන් භික්ෂූන් වහන්සේලාට දේශනා කළ පහක් දක්වන්න.
126. පංච බල නම් කරන්න.
127. **"ආරෝග්‍ය පරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං"** ගාථාව සම්පූර්ණ කර එහි අර්ථය ලියන්න.

## 18 නිවැරදි ආහාර පරිභෝජනයෙන් සුවසේ වෙසෙමු

128. අවිධිමත් ලෙස, එමෙන්ම ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් පස් දෙනෙකු පිළිබඳව බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වෙයි. ඔවුන් කවුරුන් ද?
129. "හැම කල්හිම මනා සිහියෙන් යුතුව පමණ දැන ආහාර ගන්නා මිනිසුන්ගේ දුක් වේදනාවන් තුනී වේ. එසේ සීමාව, ප්‍රමාණය දැන ආහාර වැළඳූ විට ආහාර සෙමෙන් දිරයි. ඔවුන්ගේ ආයුෂය වැඩි වන්නේය." මෙසේ ලොකු කුඩා කාහටත් වැදගත් වන මෙම පුවත දැක්වෙන සූත්‍රය කුමක් ද?
130. ආහාර පරිභෝජනය හා බැඳුණු සේඛියා 05ක් ලියා දක්වන්න.
131. දෝණපාක සූත්‍රයට අනුව පමණ දැන ආහාර ගැනීමෙන් ලැබෙන ප්‍රතිඵල දෙකක් ලියන්න.

## 19 සසුන සුරැකි සංගායනා

132. ධර්ම සංගායනාවක් යනු කුමක් ද?
133. ථේරවාද බෞද්ධ සම්ප්‍රදාය මගින් පැවැත්වූ සංගායනා ගණන කීයද?
134. අලුවිහාර සංගීතිය හෙවත් සිව්වන ථේරවාද සංගීතියේ දී ශ්‍රී ලාංකික ගෞරවනීය මහා සංඝරත්නය විසින් කරන ලද උතුම් යුග මෙහෙවර කුමක් ද?
135. අලුවිහාර සංගිතිය සිදුවූයේ කුමන රාජ්‍ය සමයෙහි ද?
136. භාරතයේ ධර්මාශෝක අධිරාජයාණන්ගෙන් අනතුරුව බුදු දහමේ උන්නතියට ඉමහත් සේවාවක් කළ නරපතියෙකු ලෙස ඉතිහාසගත වන රජතුමා කවුරුන් ද?
137. කණිෂ්ක ධර්ම සංගායනාව හඳුන්වන තවත් නමක් ලියා දක්වන්න.

## 20 හෙළ කලාවන් සුරකිමු

138. ත්‍රිවිධ චෛත්‍ය නම් කරන්න.
139. ස්තූපය හැඳින්වීම සඳහා විවිධ නම් භාවිත කරයි. ඉන් 04ක් ලියා දක්වන්න.
140. ත්‍රිවිධ චෛත්‍ය වන්දනා කළ යුතු අනු පිළිවෙල දක්වන්න
141. ලක්දිව බුදු දහම ස්ථාපිත වීමත් සමග ගොඩනැගුණු මුල්ම ස්තූපය ලෙස සැලකෙන්නේ කුමක් ද?
142. ථූපාරාමය දාගැබෙහි තැන්පත් කොට ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ කුමන ධාතූන් වහන්සේ ද?
143. ගර්භයේ ස්වරූපය අනුව ස්තූපය ප්‍රධාන වශයෙන් ආකාර කීයකට වර්ග කෙරේ ද?
144. ස්තූප සයාකාරය ලියා දක්වන්න.
145. ලංකාව තුළ දැක ගත හැකි ස්තූප ආකෘති වලට උදාහරණය බැගින් ලියා දක්වන්න.
146. ස්තූපයේ පවත්නා කලාත්මක බව වැඩි දියුණු කිරීමට ස්තූපාංග උපකාරී වී ඇත. ලක්දිව අංග සම්පූර්ණ ස්තූපයක ඇති අංග මොනවා ද?
147. චේතියඝර හෙවත් වටදාගෙය නමින් හැඳින්වෙන්නේ කුමක් ද?

chamindawijekumara@gmail.com

148. ලංකාවේ චෛතියඝර පිහිටි බවට සාක්ෂි දරණ ස්තූප මොනවා ද?
149. මෙතෙක් හමු වී ඇති කලාත්මක බවින් උසස්ම බෝධිඝරය පිහිටා ඇත්තේ කොහේ ද?
150. ‘‘අඩ්ඪචන්ද පාසාණ’’ යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?
151. දැනට හමු වී ඇති සඳකඩපහණ් කිහිපය අතර කලාත්මක බවින් මුල් තැන ගන්නේ කුමන සඳකඩපහණද?

## 21 බෞද්ධ සාහිත්‍යය රස විඳිමු

152. ගුත්තිල කාව්‍ය රචනා කරන ලද්දේ කවුරුන් ද?
153. අනුරාධපුර යුගයට අයත් පැරණිම සිංහල පද්‍ය හමුවන්නේ කුමන ස්ථානයකින් ද?
154. අමාවතුර රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද? කුමන සාහිත්‍ය යුගයේ ද?
155. බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී ගුණ වර්ණනා කරන ග්‍රන්ථය කුමක් ද?
156. මුව දෙව්දාවත සහ සසදාවත යන කාව්‍ය දෙකට වස්තු විෂය වී ඇති ජාතක කතා 02 ලියා දක්වන්න.
157. දඹදෙණි සාහිත්‍ය යුගයේ රචනා වූ කෘති 5ක් ලියා දක්වන්න.
158. භාරතීය අලංකාර ශාස්ත්‍රය පදනම් කරගෙන නිර්මාණය වූ සිංහලයේ විශිෂ්ටතම මහා කාව්‍ය සහ එයට පාදක කරගත් ජාතක කතාව කුමක් ද ?
159. බුදුරදුන්ගේ අරහං ගුණය තේමා කරගෙන රචනා කළ කෘතිය කුමක් ද?

## 22 රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්

160. රාජ්‍ය පාලනයට උපකාරී වන දස සක්විති වත් එක්තරා ප්‍රවාද කතාවක් වශයෙන් දැක්වෙන නිකාය හා සූත්‍රය කුමක් ද?
161. දස සක්විතිවත් අතරින් 03ක් ලියා දක්වන්න.
162. බුද්ධ කාලීන භාරතයේ පැවති ප්‍රධාන පාලන ක්‍රම 02 නම් කරන්න.
163. සප්ත අපරිහාණීය ධර්ම අතරින් 03ක් ලියා දක්වන්න.
164. සතර සංග්‍රහ වස්තු ලියා දක්වන්න.
165. සිව්බඹ විහරණ ලියා දක්වන්න.
166. සතර අගතිය ලියා දක්වන්න.
167. රාජ්‍ය පාලනයට උදව් කරගත හැකි බෞද්ධ ඉගැන්වීම් 5ක් නම් කරන්න.

## 23 ශ්‍රද්ධාව නිවන් මගෙහි පිවිසුමයි

168. ශ්‍රද්ධාවේ ආකාර දෙක නම් කරන්න.
169. අමූලිකා ශ්‍රද්ධාව යනු හඳුන්වන්න.
170. අවෙච්චප්පසාදය යනු කුමක් ද?
171. ශ්‍රද්ධාවන්තයෙකු තුළ දැකිය හැකි ලක්ෂණ මොනවා ද?
172. අකාරවතී ශ්‍රද්ධාව යනු කුමක් ද?
173. වඩාත් සමීප හේතු සාධක පමණක් සලකා බලා බුද්ධාදී රත්නත්‍රය පිළිබඳව නිගමනවලට නොඑළඹිය යුතු බව පැහැදිලි කෙරෙන සූත්‍ර දේශනාවක් නම් කරන්න.